

# වැනසෙන ආවේණිකයෝ

ශ්‍රීට දශක දෙක තුනකට ඉහත දී සිරිපා සමය ආරම්භ වීමත් සමඟ සිරිපා කරුණාවට පෙළ ගැසුන සමනළ පෙරහර අද ඉතාම විරල දසුනක්ව ඇත. නෙක පැහැගත් සමනළයන්ගේ පෙළ ගැස්ම එදා පරිසරය තුළ ආකර්ෂණීය බවක් නිරූපනය කළ බව සැබෑවක්මය. එහෙත් අද මොවුන්ගේ අතුරුදහන් වීමට හේතු පාදක කරුණු කවරේදැයි ඔබ සිතුවා ද?

සමනළයන් ප්‍රජනන කාර්යයන් සඳහා බිජුලන ඉලුක් කහට අරළු බුළු නෙල්ලි වැනි ශාක විශේෂ වනාන්තර ගිනි තැබීමත් සමඟ විනාශ වීම ඔවුන් ගේ පැවැත්මට බාධාවක්ව ඇත.


නැවත වන වගා කිරීමේ දී භාවිත කරන පයිනස්, ඇකේඩියා ඉයුකැලිප්ටස් වැනි ශාක මඟින් සමනළ ප්‍රජනන කටයුතුවලට හිතකර පරිසර පද්ධතියක් බිහි නොවීමේ ප්‍රවණතාව ශීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී.


බලු නගුට, ඇත්හොඬ, හිඟුරු වැනි වල් පැළෑටි ගහනය ඉවත් වීම මඟින් සමනළයන් ගේ ආහාර ප්‍රභව ද අතුරුදහන්ව ඇත.

සමනළයන් ගේ ගහනය බහුල, දිය උල්පත් ගංඟා ඇළ දොළ ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශවල පරිසර තත්ත්වය ද සමනළයන් ගේ ජීවන රටාවට අහිතකර ලෙස පිළියෙළවීම ඔවුන්ගේ පැවැත්මට එල්ල වී ඇති තර්ජන අතරට ගැනේ.

කෘමිනාශක මඟින් ද සමනළයන් ගේ පැවැත්මට එල්ල වී ඇති තර්ජනය සුළුකොට තැකීමට නොහැකි ය. මිනිසා විසින් ම ඇති කරන ලද මෙම ප්‍රතිවිරෝධී තත්ත්වයන් මත අද අපට ආවේණික වූ සමනළ විශේෂ බොහොමයක් ම දැක්මෙන් අතුරුදහන්ව ඇත.

සමනළ විශේෂ 242 කට උරුම කම් කියන ශ්‍රී ලංකාවට ආවේණික විශේෂ 42 කි. ඔවුන් කුල 09 කට අයත් ය. මෙයින් දුර්ලබ විශේෂ 11 ක්ද ඉතා දුර්ලබ විශේෂ 41 ක්ද, තර්ජනයට ලක් වූ පිරිස 81 ක් ද වේ. රතු දත්ත (Red list) ලැයිස්තුවට ඇතුළත් ගණන 04 කි.





සමනළ වර්ගයට අයත් කෘමීන් "ලෙපි-ඩොප්ටෝරා" (Lepidoptera) යන විද්‍යාත්මක නමින් හඳුන්වයි. 1735 වර්ෂයේ දී 'කැරොලස් ලීනස්" නම් සත්ත්ව විද්‍යාඥයා විසින් මෙම නාමය භාවිත කළ අතර එතැන් සිට සියලුම ස්වාභාවික විද්‍යාඥයන් සමනළයන් හැඳින්වීම සඳහා මෙම නාමය භාවිත කරන ලදී.

1945 වර්ෂය වන විට සමනළ විශේෂ 80,000 කට වැඩි ප්‍රමාණයක් හඳුනා ගෙන සිටි අතර එයින් 12,000 ක් පමණ බ්‍රිතාන්‍ය දූපත් වලින් ද 10,000 ක් ඇමරිකාව සහ උතුරු මෙක්සිකෝවෙන් ද හඳුනා ගෙන ඇත.

උතුරු ඇමරිකාවේ "Iphiclides Narcellus" විද්‍යාත්මක නමින් හඳුන්වන Swallow Taill" නම් විශේෂය සෘතු තුනක දී ස්වරූප තුනකින් පෙනී සිටී. යුරෝපයෙ"Arasehnia Lerana විශේෂ වසන්ත කාලයේ දී Lerana නමින් හඳුන්වනු ලබයි.

ග්‍රීක බසින් Lepidoptera යනු ශල්කමය තටු (Lepts - Pteron)- තටු යන අදහසයි. සමනළයකු අතින් ඇල්ලූ විට අත තැවරෙන පිටි ගතිය මෙයින් අදහස් වේ.

හිස, උරස, සහ උදරය යන ප්‍රධාන කොටස් තුනකින් හෙබි සමනළයාට පාද හයක් ද, තටු හතරක් ද, සංයුක්ත අක්ෂි දෙකක් ද, ශුණ්ඩාවක් සහ ස්පර්ශක (Antenna) යුගලක් ද වේ. හිස කුඩාය. අඩ කවාකාර ය. ඇස් දෙක ඉතා සරල ලෙස පිහිටා ඇත.


සමනළයා ගේ ජීවන චක්‍රය, බිත්තර, කීටයා, කෝෂ, වැඩුන සමනළයා ලෙස අවස්ථා හතරකි. බිත්තරවලින් පිටතට එන පණුවන් ගස්වැල් ආහාර කොට ගනී. ඉන් අනතුරුව කෝෂය සාදා එතුල සිට මේරූ අවස්ථාවට පත් වීමෙන් සමනළයකු ලෙසින් පරිසරයට සම්බන්ධ වේ.තෘණ බිම්, ලඳු, වනාන්තර සිය ජීවන රටාවට උචිත පරිසරය ලෙස යොදා ගනී. බොහෝ සමනළුන් මඳ හිරු එළිය තැපීමටත් පොළොවේ වැඩි වේලාවක් වසා සිටීමටත් ප්‍රිය කරති. සෑම සමනළයෙක් ම වැඩිපුර ක්‍රියාශීලි වන්නේ උදේ 7.30 සහ 10.30 අතර කාලයේදී මෙන්ම හවස 3.30 සහ 5.30 අතර කාලයේදී ය.


සමනළයන්ගෙන් බොහෝ දෙනකු මල් පැණි ආහාර කොට ගනී. පලතුරු යුෂ උරා බොන විශේෂ සහ තුනී ජලය සමල මිශ්‍ර වූ මඩ ආහාර ලෙස ගන්නා සමනළුන් ද වෙති. මළකුණුපවල යුෂ උරා බොන විශේෂ ද සිටිති.


සමනළුන්ට සතුරන් බොහෝය. හිකනලුන් , කටුස්සන්, කුරුල්ලන් එවැනි සතුරු විශේෂ ය. මෙම තත්ත්වයන් මඟ හැරීමට සමනළුන් ගේ සුදානමක් ද ඇත. පරිසරයට අනුවර්තන වෙන "Common Crow" සමනළයා සිය ගුද මාර්ගය ආශ්‍රයේ ඇති කහපාට මලක් වැනි උපාංගය පුම්බා එමඟින් දුගඳක් නිකුත් කරනු ලබයි.

ඇතැම් සමනළයන් ගේ ගැහැනු පිරිමි අතර වෙනස්කම් ඇත. (Common Nine) (Nine Papilio – Clytia) විශේෂයෙහි පිරිමි සතා දුඹුරු පැහැති ය. ගැහැනු සතා සුදු නිල් පැහැයකි. පිරිමි සතා ගැහැනු සතාට වඩා කුඩා ය.

The Tailed Jay (Graphian agamennum) සමනළයාගේ ගැහැනු පිරිමි අතර වෙනසක් නැත. ප්‍රමාණයෙන් සහ වර්ණයෙන් එක සමානය. පිරිමි සතාගේ වලිග කොටස දිගින් වැඩි ය.







සමනළයන් ගේ පිහාටු-වල වර්ණවත් බව ප්‍රදර්ශනය වන්නේ ඉගිළෙන විට ය. මතුපිට පියාපත් වර්ණවත් වුවද එහි යටි ප්‍රදේශය දුඹුරු පැහැති ය. මෙම පරිසර ගැළපීම නිසා ම යමක වසා සිටින විට සමනළයා ඉස්මතුව නොපෙනීම සතුරන්ගෙන් ආරක්ෂාව ලැබීමට හේතු වේ. Blue Oaklead සමනළයා මේ සඳහා ඉතාම හොඳ නිදසුන වේ.

සමූහ ලෙස ගැවසෙන සමනළයන් සංක්‍රමණශීලී කෘමියෙකි. ඇතැම් සමනළ විශේෂ ලොව පුරා දක්නට ලැබෙන්නේ මේ නිසා ය. Hawk Noth Vanesa Cardui විශේෂ දකුණු අප්‍රිකාව හැර ලෝකයේ බොහෝ ප්‍රදේශවල දක්නට ඇත. Agrotis Ypsiloniy Heliothis Absoleta වෙනතක් රටවලින් පැමිණෙන විශේෂ වේ. Lampider Boeticus ලෝකයේ සියලුම උෂ්ණ ප්‍රදේශවලින් මුන ගැසේ. Painted Lady නමින් හඳුන්වන Vanasa Curdne සමනළ විශේෂය වසන්ත කාලයේ දී උතුරු අප්‍රිකාවට සහ දකුණු යුරෝපයට සංචාරය කරති. විටෙක ඔවුහු අයිස්ලන්තය තෙක් ගමන් කරති.

සංක්‍රමණය වන අතරවාරයේදී ම සංවාසයේ යෙදී බිත්තර දැමීම සිදු වේ.

දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි මාසවල දී සමනළ ගමන් රටාව සමනළ කන්ද දිශාවට සිදුවේ. මෙම කාලයේ දී අනුරාධපුරය, හලාවත, පොළොන්නරුව, අම්පාර, මහියංගනය, මඩකලපුව, හම්බන්තොට වැනි ප්‍රදේශවල සිට, සමනළ සමූහ ශ්‍රී පාදය දෙසට ඇදෙන නිසාවෙන් ම සමනළයන් ද සිරිපා කරුණා කරන බවට, සිංහල ජන විශ්වාසයක් පවතී.

## ශ්‍රී ලංකානට ආවේණික සමනළ කුල කුලය

1. Danide 2. Satyridae 3. Amathusidae 4. Nymphalidae 5. Erycinidae 6. Hesperidae 7. Papilioniadae 8. Lycaenidae 9. Pieridae ඩැනිඩේ, සැටිරිඩේ, ඇමතුසිඩේ, නිම්පිලිඩේ, එරිසිනිඩේ, හෙස්පෙරිඩේ, පැපිලියොනිඩේ, ලයිසෙනිඩේ, පියරිඩේ

**සමනළයා**

1. Plain Tiger, 2. White Four Ring 3. Southern Duffer, 4. The Baron, 5. Club Beak, 6. Giant Red Eye 7. Blue Normon 8. Red Pierrot, 9. Common Grass Yellow

### ශ්‍රී ලංකාවට අවේණික විශේෂ 11 ඉංග්‍රීසි නම විශේෂ නම

Ceylon tree brown Lethe daretis 2. Cingalese bushbrown Nycalesisrama 3. Ceylon Tiger Damaus Fumala 4. Joker Bybila ilithyia 5. Ormiston's Oak blue Arhopala Ormistcni 6. Ceylon nedge blue Celastrina Lanka 7. Nilky Ceruleam Jamides Lacteata 8. Ceylon Cerulean Jamides Coruscans 9. Decorated ace Helpe decorata 10. Grass deman Udaspes folus 11. Sri Lanka Roase Atrophaneura Jophan

### රතු දත්ත ලැයිස්තුගත සමනළ විශේෂ

1. Atopnameura Jophan The Sri Lanka Rose 2. Graphium antiphates The Fire bar swordtail 3. Idea lynceas The Ceylon Tree Nymph 4. Danaus F umata The Ceylon Tiger

### ශ්‍රී ලංකාවේ සමනළුන් පිළිබඳ මූලාශ්‍ර

1. The Butterfly Favna of Ceylon 2. A Selection of the Butterflies of Sri Lanka – John and Judy Bank 1985 3. Biological Conserration in Sri Lanka – A National status Report 1991

පූනයා චාන්දනි ද සිල්වා